**ජාතික ක්‍රීඩා අරමුදල - 2013**

**--------------------------------**

ජාතික ක්‍රීඩා අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | xxxix වන ජාතික මහා ක්‍රීඩා උළලේ වියදම් | 2,480,500 | ගෙවීම් විස්තර |
| (ii) | ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට ගෙවීම් | 236,000 | ලදුපත් |
| (iii) | පාපන්දු සම්මේලනයේ ලේකම්ගේ විදෙස් නවාතැන් වියදම් | 110,000 | බිල්පත් |

**2.3 නීති ,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| **නීති, රීති ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 2008 අප්‍රේල් 28 දිනැති අංක. 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) විදේශ ගමන් සඳහා ගුවන් ටිකට් මිලදී ගැනීම සෑම විටම රජයේ අනුමත ආයතන වෙතින් ආසන වෙන්කරවා ගත යුතු වුවත් ඊට පටහැනිව ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ කැඳවීමට අනුව නිලධාරීන් තුන්දෙනෙකු විදේශගතවීමට අදාලව, පුද්ගලික සමාගමක් හරහා විදේශ ගුවන් සමාගමකින් ව්‍යාපාරික පංතියේ ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සඳහා ක්‍රීඩා අරමුදලෙන් රු.1,151,000 ක් වැය කර තිබුණ අතර ජාත්‍යන්තර පාසල් නෙට්බෝල් තරඟාවලියට සහභාගී වීම සඳහා රු.121,350 ක් වියදම්කර ගුවන් ටිකට්පත් පුද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (2) වගන්තිය | එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතු වුවත් එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,468,672 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය වූ රු.19,923,798 විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 32,392,470 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1 කාර්යසාධනය**

---------------

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්යයදීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම අරමුදලේ ප්‍රධාන අරමුණු වුවත් ඒ සඳහා සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. ක්‍රීඩා සමාජ සහ පුද්ගලයින් විසින් ක්‍රීඩා කටයුත්තක් සඳහා කරනු ලබන ඉල්ලීමක් අනුව යම් මුදලක් ලබාදීම පමණක් දැනට අරමුදලේ කාර්යභාරය සීමාවී ඇති බව නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**5.1 අයවැය ලේඛනමය පාලනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රීඩා අරමුදලේ 2013 වර්ෂයට අදාල අයවැය 2012 දෙසැම්බර් 31 දින අනුමත කරගෙන තිබුණද සංශෝධිත අයවැය අනුමත කර තිබුණේ 2013 දෙසැම්බර්18 දිනදීය.

(ආ) අයවැය පිළියෙල කිරීමේදී සාක් මෙහෙයුම් කාර්යාලයේ වියදම් වෙනුවෙන් අයවැය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබුණද වර්ෂයේදී රු.155,000 ක් කාර්යාලයේ වියදම් වෙනුවෙන් වැය කර තිබුණි.

(ඇ) සත්‍ය ආදායම අයවැයගත ආදායමට වඩා රු. 20,610,057 කින් එනම් සියයට 22 කින් අඩු වී ඇති අතර සත්‍ය වියදම අයවැයගත වියදමට වඩා රු.8,096,384 කින් එනම් සියයට 9 කින් අඩු වී තිබුණි. තවද අයවැය මඟින් රු.45,000 ක ශුද්ධ අතිරික්තයක් අපේක්ෂා කළද සත්‍ය වශයෙන් වාර්තා කර තිබුණේ රු.12,468,672 ක ශුද්ධ ඌණතාවයකි.

**6. පද්ධති හා පාලනයන්**

**----------------------**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට වරින්වරයොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අයවැය පාලනය

(ආ) අරමුදල් උපයෝජනය

(ඇ) ආදායම්

(ඈ) ගිණුම්කරණය

(ඉ) ආධාර ප්‍රදානය